
2019. 10. 29 ලංකාදීප

පිටුව 4

# අතුරු සම්මත ගිණුමේ පතුරු යයිද?

**2020 පළමු මාස හතර සඳහා වූ අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවේදී සම්මත විය. එම ගිණුමට අනුව අපේක්ෂිත රාජ්‍ය වියදම රුපියල් බිලියන 1474කි. ආදායම රුපියල් බිලියන 753කි. මුළු ණය ගැනීම රුපියල් බිලියන 721කි. මෙම අතුරු සම්මත ගිණුම ඡන්ද විමසීමකින් තොරව සම්මත වීම මෙවර අතුරු සම්මත ගිණුමේ විශේෂත්වයකි.**



2020 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ද නියමිතය. එසේ වුවහොත් යළිත් අතුරු සම්මත ගිණුමක් ගෙන ඒමට ඊළඟට එන ආණ්ඩුවට සිදුවෙයි.

මෙයින් පෙනීයන්නේ වැටුණු ආර්ථිකය ශක්තිමත් කර නොගත්තොත් ජනාධිපතිවරණයේ දී ලබා දුන් පොරොන්දු ඉටු කිරීමට යාමේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය ඉදිරියේදී දරුණු කඩාවැටීමකට ලක් වීමට ඉඩ තිබෙන බවය.

රටක රාජ්‍ය මූල්‍ය කටයුතුවලට ඇතුළත් කරන්නේ අය-වැය-ණය යන ත්‍රිවිධ කටයුතුය.

මෙම කටයුතුවල වැදගත්කම මනිනු ලබන්නේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂවය. වසර 10න් 10ට ශ්‍රී ලංකාවේ විවිධ ආණ්ඩු යටතේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා සටහනට අනුව බලාගත හැකිය. 1950 වර්ෂයේ සියයට 16 ක් වූ රාජ්‍ය ආදායම 1980 වන විට සියයට 24 දක්වා වැඩිකර ගැනීමට පැවැති ආණ්ඩු සමත් වුවද මැතිවරණ දිනා ගැනීමට විවිධ සහනාධාර පොරොන්දු ලබාදීම නිසා රාජ්‍ය වියදම 1950 වසරේ සියයට 20 ක මට්ටමේ සිට 1980 වන විට සියයට 43 දක්වා දෙගුණයකට වඩා වැඩිකර ගැනීමට සිදුවිය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ අයවැය හිඟය මේ කාලයි තුළ සියයට 4 සිට සියයට 19 දක්වා වැඩි වීමය. ඒ නිසාම දේශීය හා විදේශීය ණයවලින් සමන්විත මුළු රාජ්‍ය ණය ප්‍රතිශතය සියයට 17 සිට සියයට 77 ට වැඩිවිය.

**සංඛ්‍යා සටහන**

**වසර 10න් 10ට ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය**

| වර්ෂය (ද.දේ.නි%) | රාජ්‍ය ආදායම (ද.දේ.නි%) | රාජ්‍ය වියදම (ද.දේ.නි%) | හිඟය (ද.දේ.නි%) | රාජ්‍ය ණය (ද.දේ.නි%) |
|---|---|---|---|---|
| 1950 | 16 | 20 | -4 | 17% |
| 1960 | 21 | 27 | -6 | 34% |
| 1970 | 21 | 27 | -6 | 64% |
| 1980 | 24 | 43 | -19 | 77% |
| 1990 | 23 | 31 | -8 | 97% |
| 2000 | 17 | 27 | -10 | 97% |
| 2005 | 17 | 24 | -7 | 91% |
| 2010 | 13 | 20 | -7 | 72% |
| 2014 | 12 | 17 | -5 | 71% |
| 2018 | 13 | 19 | -6 | 83% |

මෙම තත්ත්වය 2000 වන විට තව දුරටත් නරක අතට හැරුණු අතර රාජ්‍ය ආදායම සියයට 17ක් තරම් අඩු මට්ටමකට පත්විය. රාජ්‍ය වියදම් සියයට 27 ක් වීම නිසා රාජ්‍ය අයවැය හිඟය සියයට 10 ක් වී රාජ්‍ය ණය සියයට 97ක් විය. 2005 මහින්ද රාජපක්ෂ රජය බලයට පැමිණෙන විට රාජ්‍ය ආදායම සියයට 17 ක මට්ටමක තිබුණු අතර ඊට සාපේක්ෂව රාජ්‍ය වියදම සියයට 24 දක්වා අඩුකර ගැනීම නිසා අයවැය හිඟය සියයට 7 කට අඩු කර ගැනීමට සමත් විය. එහෙත් රාජ්‍ය ණය සියයට 91 දක්වා ඉතාම ඉහළ මට්ටමක් වාර්තා කළේය.

මහින්ද ජනාධිපතිගේ ආණ්ඩුව බලයෙන් ඉවත්වීම එනම් 2014 වනවිට රාජ්‍ය ආදායම සියයට 12 ක් තරම් ඉතාම අඩු මට්ටමකට පත් වුවත් (බදු සහන ලබාදීම නිසා) රාජ්‍ය වියදම් තාර්කික කොට ඉතිහාසයේ අඩුම මට්ටම වූ සියයට 17කට අඩුකර ගත්තේය. ඒ නිසාම අයවැය හිඟය සියයට 5 කට අඩු කර ගැනීමට සමත්විය. යහපාලන රජය යටතේ රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට බදු වැඩි කළත් උදා- (VAT 11% සිට 15%) ආර්ථික වර්ධනය අඩපණ වූ නිසා ආර්ථික ක්‍රියාකාරිත්වය මන්දගාමී වීමෙන් රාජ්‍ය ආදායම සියයට 13 කට සීමා විය. රාජ්‍ය වියදම ද සියයට 19 ක් වී අයවැය හිඟය 5%-6% අතර මට්ටමකට ගෙන ඒමට සමත් විය. එහෙත් රාජ්‍ය ණය සියයට 83ක් බවට පත්විය. අද වනවිට එය සියයට 100 කට ආසන්න මට්ටමකට පත්ව තිබේ. තතු මෙසේ තිබියදී ජනාධිපතිවරණයක් මේ වසරේදී පැවැත්වෙන අතර ලබන



ප්‍රවීණ ආර්ථික විශ්ලේෂක

**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

වසරේදී පාර්ලිමේන්තු මැතිවරණයක්ද පැවැත්වීමට නියමිතය. ඒ නිසාම ජනතාවට ප්‍රධාන අපේක්ෂක යන් දෙදෙනාම පොරොන්දු රැසක් දෙමින් සිටින අතර එම පොරොන්දු ඉටු කිරීමට ඉදිරි ආණ්ඩුවකට දරන්නට සිදුවන වියදම් පිළිබඳ සැසඳුමක් දෙවැනි වගුවේ ඉදිරිපත් කර ඇත.

මෙම වගුව තුළ දක්වා ඇත්තේ දැනට තිබෙන පොරොන්දු ඉටු කිරීමට අවශ්‍ය මුදල්ය. මීට අමතරව පොහොර නොමිලේ දීමට දෙදෙනාම පොරොන්දුවී තිබෙන අතර එයට යන වියදම් තවම ගණන් බලා නැත. ඉදිරියේදී තව තවත් පොරොන්දු දීමට ඉඩ ඇත. මෙවැනි තත්ත්වයක් තුළ ඉදිරි ආණ්ඩුවක මුදල් අමැතිවරයාට අලුතින් ඉදිරිපත් කළ අතුරු සම්මත ගිණුමට අමතරව මෙම සහන සඳහා ද මුදල් සොයා ගැනීමට සිදුවීම වැළැක්විය නොහැකිය. ඒ නිසා මෙවර ජනාධිපතිවරණයේදී වැදගත් වන්නේ ජනාධිපතිවරණයෙන් පසු පත්වන ආණ්ඩුවේ අගමැති හා මුදල් ඇමැති ලෙස පත්වන පුද්ගලයා හා ඇමැතිවරුන් ලෙස පත්වීමට සිටින අය කවුදැයි සොයා බලා ඔවුන් අතීතයේදීත් එබඳු නිලතල දැරුවා නම් වැඩ කළ ආකාරය බලා බුද්ධිමත් තීරණයක් ගැනීමය. එසේ නොගත්තොත් රටත්, ආර්ථිකයත්, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයත් දරුණු කඩාවැටීමකට ලක්වීම වැළැක්විය නොහැකි බව අවසාන වශයෙන් සඳහන් කරමු.

**අයවැයට බලපාන ජනාධිපති මැතිවරණ පොරොන්දු වියදම්**

| පොහොට්ටුවේ ජනාධිපති අපේක්ෂක පොරොන්දු ඉටු කිරීමට යන වියදම් | | හංසයා යටතේ ඉදිරිපත්වන ජනාධිපති අපේක්ෂක පොරොන්දු ඉටු කිරීමට යන වියදම් | |
|---|---|---|---|
| • VAT බද්ද 15% සිට 8% අඩු කිරීම නිසා අහිමිවන මුදල (රු. බිලියන) | 350 | • වගා හානි ස්ථිර රක්ෂණ ආවරණයට (රු. මිලියන) | 50ට |
| • උපයන විට ගෙවීමේ බද්ද අහෝසි කිරීම නිසා ආදායම අහිමිවීම | 41 | • වී සහතික මිලට (රු. බිලියන) | 6.58 |
| | | • සමෘද්ධිය සමග ජන සවිය දීමට (රු. බිලියන) | 136 |
| • හම්බන්තොට වරාය පවරා ගැනීමට යන වියදම (ඩොලර් බිලියන) | 1.12 | • රණවිරු නිවාසවලින් අය කළ මුදල් දීමට (රු. බිලියන) | 400 |
| • කෘෂිකාර්මික බදු සහන දීම නිසා අහිමි වන ආදායම (රු. බිලියන) | 63 | • පාසල් නිල ඇඳුම් හා ආහාර දීමට (බිලියන) | 52 |